ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

**කොළඹ**

## පුවත්පත් නිවේදනය

**<u>NCGG - SLIDA අවබෝධතා ගිවිසුම යටතේ පළමු ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් වේ</u>**

වසර 5ක් පුරා ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 1500කට පුහුණුව ලබා දීම සහ ඔවුන්ගේ ධාරිතා ගොඩනැගීම සඳහා අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් 2024 දෙසැම්බර් මස සිදු කළ ඉන්දීය සංචාරය අතරතුර දී ඉන්දියාවේ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය (NCGG) සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) අතර අත්සන් තබන ලදී.

2. මෙම අවබෝධතා ගිවිසුම යටතේ පළමු වැඩසටහන 2025 අප්‍රේල් 21 වන දින සිට මැයි 02 වන දින දක්වා NCGG හිදී පැවැත්වුණු අතර ඒ සඳහා නිලධාරීන් 41 දෙනෙකු සහභාගී වූහ. ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි, මෙම වැඩසටහන 'පාලනය තුළ ඩිජිටල්කරණය' යන තේමාව ඔස්සේ පැවැත්විණ. ඩිජිටල් සේවා සැපයීම, ඩිජිටල් පොදු යටිතල පහසුකම්, ඩිජිටල් ගෙවීම් හරහා මූල්‍ය අන්තර්ග්‍රහණීයත්වය සහ මහජන දුක්ගැනවිලි විසඳන පද්ධති නව්‍යකරණය වැනි අංශ ආවරණය කරමින් සැසි ගණනාවක් මෙම වැඩසටහන යටතේ පවත්වන ලදී. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් ආයුෂ්මාන් භාරත් ඩිජිටල් මෙහෙයුම, e-Office, GeM , ආධාර් සහ ගති ශක්ති ඇතුළු ඩිජිටල් ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ මුලපිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

3. 2025 මැයි 08 වන දින SLIDA ආයතනයේ දී ප්‍රථම පුහුණු වැඩසටහන සඳහා සහභාගී වන නිලධාරීන් සමඟ පැවති හමුවක දී ශ්‍රී ලංකාවේ ඉන්දීය

මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා ධාරිතා ගොඩනැගීම දෙරට අතර සංවර්ධන සහයෝගීතාවයේ වැදගත් කුළුණක් බව අවධාරණය කළේය. ශ්‍රී ලංකාව ඉන්දියාව විසින් පිරිනමන ශිෂ්‍යත්ව සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැඩිම සංඛ්‍යාවක් හිමිවන රටක් බව ද එතුමා සඳහන් කළේය. ශ්‍රී ලාංකිකයන් සඳහා ධාරිතා ගොඩ නැංවීමේ අවස්ථාවන් ඉහළ නැංවීම සඳහා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 700කට අමතර පුහුණු අවස්ථාවන් පිරිනමන බව නිවේදනය කළ බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. මේ සමඟ වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000කට ප්‍රතිලාභ ගෙන එන ධාරිතා වැඩසටහන යටතේ පළමුව පුහුණුව හිමි වන පිරිස මෙම කණ්ඩායම බව එතුමා සඳහන් කළේය.

4. මෙම හමුව සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එස්. ආලෝක බණ්ඩාර මහතා, SLIDA අධ්‍යක්ෂ ජනෙරාල් ඒ. වී. ජනාදර මහතා, SLIDA ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

5. පළමු NCGG - SLIDA වැඩසටහන සඳහා සහභාගී වූ කණ්ඩායමේ ඉහළ ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් නිලධාරීන් 40 දෙනෙකුගෙන් සමන්විත දෙවන කණ්ඩායම සඳහා SLIDA හි ඉල්ලීම අනුව මෙම තේමාව යටතේ ම පුහුණු වැඩසටහනක් 2025 ජූනි මස මුල පැවැත්වීමට සැලසුම් කරමින් පවතී.

***

කොළඹ
2025 මැයි 09